# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1450/23 - 2006 ජුනි 22 වැනි බ්‍රහස්පතින්දා - 2006.06.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමහ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2006 ජුනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2006 අංක 1 දරන සේවක අධ්‍යාපන ආයතන (සංශෝධන ) නියමාවලිය වශයෙන් හඳුන්වනු ලබන අතර 2006.02.20 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමහ කියවිය යුතු එම පනතේ 140 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ නියමාවලියක් බවට සලකනු ලබන සහ 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1979 අංක 11 දරන සේවක අධ්‍යාපන ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.–

(අ) එහි 1 වන ඡේදයේ " සේවක අධ්‍යාපන ආයතන නියමාවලිය " යන වචන වෙනුවට " මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි 3 වන ඡේදයේ " සේවක අධ්‍යාපන ආයතනය " යන වචන වෙනුවට " මානව සම්පත් අභිවර්ධන ආයතනය " යන වචන ආදේශ කිරීමෙන් ;

3. එම නියමාවලියේ හෝ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් යම් ලේඛනයක " සේවක අධ්‍යාපන ආයතනය " යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයකදී, සියලු කාර්ය සඳහා එය " මානව සම්පත් අභිවර්ධන ආයතනය " යන යෙදුමට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

07 – 75

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A – G 007211—800 (2006/06)